# 7 පරිච්ඡේදය

## තනතුරු නාම

දඹදෙණි කාලයෙහි භික්ෂූන්ට පදවි හෝ තනතුරු පිරිනැමීමේ සිරිතක් පැවතුණු බව දඹදෙණි කතිකාවතින් හෙළි වේ. මාහිමි (=මහාස්වාමි: පා. මහාසාමි), මහතෙර (=මහාස්ථවිර, මාතෙරා: පා. මහාථේර), අයතැන් (=මූල, ආයතැන්: පා. ආයතන, සඞ්ඝ, මූල) අයතැන් වැළත, මහාපරිවේණාධිපති, පරිවේණාධිපති, තෙර (=ස්ථවිර: පා. ථේර), කාරක සභික ධුරය යන මේවා එම පදවි නාම හෝ තනතුරු නාම හැටියට සඳහන් වෙයි. මේවා (I) පූජාවලියෙහි සහ (II) මහාවංසයෙහි පිළිවෙළින් ස්ථානාන්තර සහ ධානාන්තර වශයෙනුත් (III) දළදාසිරිතෙහි පදවි වශයෙනුත් සඳහන් වේ.[1]

### මාහිමි

මෙය දිඹුලාගල මහාකාශ්‍යප මහාස්ථවිරයන්ගෙන් පසුව පොළොන්නරු කාලයෙහිත්, එසේ ම දඹදෙණි කාලයෙහිත් ඉන් පසු කලක් ගතවනතුරුත් සංඝ සංවිධානයේ තිබූ උසස් ම පදවි නාමයයි. දඹදෙණි කතිකාවතේ සඳහන් වන මෙම පදවි නාමය දැරූ ප්‍රථම භික්ෂුව වූයේ දිඹුලාගල මහාකාශ්‍යප මහාස්ථවිරයන්ගේ ශිෂ්‍යයෙක් වූ සාරිපුත්‍ර මාහිමි ය.[2] දඹදෙණියේ රජකළ III විජයබාහු රජුගේ (ක්‍රි.ව. 1230-1234) කාලයේ මෙම පදවිය සාරිපුත්‍ර මහාස්වාමින්ගේ ශිෂ්‍ය සංඝරක්ඛිත මහාස්වාමි විසින් ද[3] II පරාක්‍රමබාහු රජතුමා (ක්‍රි.ව. 1236-1170) කතිකාවත කරන කාලය වනවිට එම පදවිය වනරතනාභිධාන මහාස්ථවිරපාදයන් වහන්සේගේ ප්‍රධාන ශිෂ්‍ය ආරණ්‍යක මේධංකර මහාස්වාමි විසින් ද දරන ලදී.[4] දඹදෙණි කතිකාවත අනුව මෙම පදවිය දැරිය හැකි වූයේ එක කලකට එක් භික්ෂුවකට පමණි.[5] එහෙත් දඹදෙණි කතිකාවත අනුව මාහිමි

---

1. (I) පූජා. 798 පි.
   (II) මවං. 82. 38, 87.64.
   (III) දළ. 45, 46 පිටු.
2. දඹ.කති. සහ පොළොන්නරුවේ විමලධම්ම හිමි, සංස. ඩී.බී.බී. පෙරේරා, 1946 (නිගමනයාය), 163 පි.; සුමනජෝති ස්ථවිර, දෙගම්මැද, **දඹදෙණි යුගය**, 2, සැලසිය 1961, 164 පි.; **ප්‍රභාසෝදය**, 3, 1938, මාර්තු-අප්‍රේල්, 138 පි.; **රාජා.** 82, පි.
3. උපස. 154.පි
4. එම. 155. පි.
5. එම. 159. පි. මහාසාමි පදවිය ගැන තව තොරතුරු සඳහා බලන්න. Rohanaddira Mendis, 'Mahasami Snagha Raja Institution in Sri Lanka' **'Vidyodaya J. Arts, Sci, Lett.**, Vol. 13, No.1, January, 1985, pp. 27-43; සුජාතපාල, කම්මැද්දේගොඩ, **සිරිරසල් භාෂිත**, කොළඹ 10. 1978, 60 සිට පිට.